කොවිඩ් 19 - සති පාසල - සබරගමු පළාත

9 ශ්‍රේණිය පුරවැසි අධ්‍යාපනය

ඒකකය - 9-3 ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

- පැවරුම් අංක 07
- ක්‍රියාකාරකම :- 9.3.6 ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු ලෙස ජාතිය ගොඩනැගීමේ කාර්යය සඳහා කැපවීමෙන් ක්‍රියා කිරීම.

  හැඳින්වීම:- ජාතිය ගොඩනැගීම සඳහා සියලු පුරවැසියන් කිසිඳු භේදයකින් තොරව කැපවීමෙන් කටයුතු කළ යුතුය. මෙහිදී වාර්ගික, ආගමික, පක්ෂ, කුල හෝ පංති වැනි විෂමතා අමතක කර සියලුදෙනා සහයෝගයෙන් කටයුතු කළ යුතුය. මෙහිදී ඵලදායී ජාතික ප්‍රතිපත්ති මත පිහිටා කටයුතු කළ යුතුය. පුරවැසියන් තම යුතුකම් නොපිරිහෙලා ඉටුකළ යුතුය. ශ්‍රී ලාංකිකයන් වශයෙන් ජාතික සමගිය හා තිරසාර සාමය ගොඩනැගීම සඳහා කැපවීමෙන් ක්‍රියාකළ යුතුය.

- ගුණාත්මය යෙදවුම් : - සංස්කෘතික සමෝදානය පෙන්නුම් කරන අවස්ථා දැක්වෙන ඡායාරූප පුවත්පත්,වාර්තා, උදාහරණ- කතරගම දේවාලය,ශ්‍රීපාදස්ථානය,සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය,ජාතික සංවර්ධනය ගොඩනැගීම සඳහා කැපවුනු නායකයින් පිළිබඳ තොරතුරු, පෙළපොත,අභ්‍යාස පොත්,පෑන්,
- ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට උපදෙස්

පියවර 01:- පෙළ පොතේ පිටු අංක 85 - 88 තෙක් හොඳින් කියවාගන්න.

පියවර 02:- ගුණාත්මය යෙදවුම් වල සඳහන් තොරතුරු සොයාගත හැකිනම් ඒවාද අධ්‍යයනය කරන්න. අභ්‍යාස පොත භාවිත කර ප්‍රශ්න ලියා පිළිතුරු සපයන්න.

ප්‍රශ්නාවලිය:-

01) ජාතිය ගොඩනැගීමේ සංකල්පය පැහැදිලි කරන්න.
02) ජාතික ප්‍රතිපත්තියක් යනු කුමක්ද?
03) ජාතික ප්‍රතිපත්තියක් තිබීමෙන් අත්වන ප්‍රතිඵල 3ක් ලියන්න.
04) ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේදී පුරවැසියෙකු ලෙස දායක විය හැකි ආකාර 3 ක් ලියන්න.
05) ජාතික ප්‍රතිපත්තිවලට අනුගතව කටයුතු කළ හැකි ආකාර මොනවාද?
06) ජාතිය ගොඩනැගීම සඳහා තම දායකත්වය කැපවීමෙන් යුතුව ලබාදීමේ වැදගත්කම පෙන්වීමට උදාහරණ සපයන්න.
07) පුරවැසියෙකු වශයෙන් ජාතිය ගොඩනැගීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 3 ක් දක්වන්න.

පසුවැඩ:- පාසල් ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක වශයෙන් ජාතිය ගොඩනැගීම සඳහා ඔබට දායක වියහැකි ආකාර ලැයිස්තු ගතකරන්න
(ලබන සතියේ ඒකක ඇගයීම් පරීක්ෂණයකට සුදානම් වන්න.)

සැකසුම:- එම්.ඒ.පද්මලතා මිය